**02. ගාථාව**

"චරං චේ නාධිගච්ඡෙය්‍ය - සෙය්‍යං සදිසමත්තනෝ,
ඒකචරියං දළ්හං කයිරා - නත්‍ථි බාලේ සහායතා."

## පදගතාර්ථය

| | | |
|---|---|---|
| **චරං** | - | (යහපත් කල්‍යාණමිත්‍රයෙකු) සොයන්නේ |
| **අත්තනෝ** | - | තමාට වඩා |
| **සෙය්‍යං** | - | ශ්‍රේෂ්ඨ වූ |
| **සදිසං** | - | තමා හා සමාන වූ |
| **චේ** | - | ඉදින් |
| **නාධිගච්ඡෙය්‍ය** | - | නො ලද්දේ නම්, |
| **ඒකචරියං** | - | තනි ව විසීම |
| **දළ්හං කයිරා** | - | දැඩි කරන්නේ ය |
| **බාලේ** | - | අඥානයා කෙරෙහි |
| **සහායතා** | - | යහළු බවක් |
| **නත්‍ථි** | - | නැත |

## භාවාර්ථය

ආශ්‍රයට නිසි කල්‍යාණමිත්‍රයෙකු සොයන්නේ, තමාට වඩා ශ්‍රේෂ්ඨ වූ හෝ තමා හා සමාන වූ මිතුරෙකු ඉදින් සොයා ගත නො හැකි නම්, අඥානයන් සමගින් යහළු බවක් නැති ව එකලා ව (තනි ව) හැසිරීම උතුම් ය.

## නිදාන කථාව

රජගහ නුවර පිප්ඵලී ගුහාවෙහි වාසය කරන මහාකාශ්‍යප මහතෙරුන් වහන්සේට සද්ධිවිහාරික භික්ෂූහු දෙනමක් වූහ. ඉන් එක්නමක් තම ගුරුවරයාට නො පමා ව වත්පිළිවෙත් කරයි. අනික් භික්ෂුව අනුන් කළ වත්පිළිවෙත් තමා කළ සේ මහතෙරුන් වහන්සේට හඟවයි.

දිනක් වත්පිළිවෙත් කරන හිමිනම සිතනුයේ 'මේ වඤ්චක හිමිනම මා විසින් කරන ලද කාර්ය තමා විසින් කරන ලද සේ දක්වයි. මොහුට හොඳ වැඩක් කරන්නෙමි' යි සිතා වඤ්චක හිමිනම බඩපුරා වළඳා නින්දට ගිය විට නානදිය උණු කොට අනික් සැළියෙක වත් කර නානකොටුවේ පිටිපස සඟවා තබා වතුර උණු කළ සැළියෙහි වාෂ්ප නැගෙන තරමට වතුර ටිකක් ඉතිරි කොට පසෙකට වී හුන්නේ ය.

නිදිගත් හිමිනම නැඟිට දියකොටුව වෙත යන්නේ වතුර සැළියෙන් හුමාලය නගිනු දැක වහා තෙරුන් වහන්සේ වෙත ගොස්, පැන් පහසු වීමට ආරාධනා කොට තෙරුන් වහන්සේ සමඟ ම නානකොටුවට වැඩියේ ය. තෙරුන් වහන්සේ දියකොටුවෙහි වතුර නො දැක "වතුර කොහි ද" යි විචාළ සේක. වඤ්චනික භික්ෂුව කාරණය තේරුම් ගෙන "දුෂ්ටයාගේ වැඩක සැටි පෙනේ ද? හිස් බඳුන ලිප උඩ තබා මොහු කොහි ගියේ ද" යි බැණ බැණ කළය ගෙන තොටට ගියේ ය.

වත් සපයන ශිෂ්‍යනම සඟවා තිබූ දිය ගෙනවිත් තැබී ය. මහතෙරුන් වහන්සේ මෙය දැන වඤ්චනික භික්ෂුව අමතා "ඇවැත්නි, අනුන් කළ දෙය තමා කළ දෙය ලෙස කීම භික්ෂූන්ට තරම් නො වේ" ය යි අවවාද කළ සේක. හෙතෙම ඉන් කිපී දෙවන දවසේ මහතෙරුන් වහන්සේ සමඟ පිඬු සිඟා නො ගොස් මහතෙරුන් වහන්සේගේ උපස්ථායක ගෙදරකට ගොස් "තෙරුන් වහන්සේ අසනීප හෙයින් විහාරයෙහි ම වැඩවසන සේක. ඒ නිසා මෙබඳු බතක් දෙව" යි කියා එය ලබා ගෙන අනුභව කොට විහාරයට වැඩියේ ය. පිඬු පිණිස ගිය ගමනේ දී තෙරුන් වහන්සේට අගනා පටරෙදිකඩෙක් ලැබිණ. තෙරුන්වහන්සේ එය තමන් වහන්සේ සමඟ පිඬු සිඟා ගිය භික්ෂුනමට දුන්හ. හෙතෙම එයින් සිවුරක් කොට පඬු පොවා ගත්තේ ය.

මහතෙරුන් වහන්සේ දෙවන දවස්හි එම උපස්ථායක ගෙට වැඩි කල්හි "අප පිළියෙළ කොට ඊයේ තරුණ භික්‍ෂුව අත එවූ දනය වළඳා ගුණ ඇද්ද"යි කියා ඔවුන් විසින් විමසූ විට මුවින් නො බැණ විහාරයට වැඩි සේක.

සවස තෙරුන් වහන්සේ වෙත පැමිණ වැඳ සිටි ඒ භික්‍ෂුනමට "ඇවැත්නි, ඔබ ඊයේ පිඬු ලබා ගත් ක්‍රමය වැරදි ය. එය පහත් වැඩකි. ඇවැත්නි, පැවිද්දන්ට පිඬු සිඟා උපන් දෙයක් විනා අකැප ලෙස විධාන කොට වැළඳීම වරදෙකැ"යි වදළ සේක.

එයින් කෝපයට පත් ඒ භික්‍ෂුනම තෙරුන් වහන්සේ කෙරෙහි වෛර බැඳ "තෙරුන් වහන්සේ ඊයේ වතුර ටිකක් නිසා මා බොරු කියන්නෙකු කොට අද තමන්ගේ දයක-ගෙදරකින් බත් මිටක් ඉල්ලා ගෙන කෑහ" යි මට නිග්‍රහ කරන්නාහු ය. තමන්ට ලැබුණු වටිනා රෙදිකඩක් අදරැති ශිෂ්‍යයාට ම දුන්හ. තෙරුන් වහන්සේ කළ සැටි හොඳ ද? කළයුත්ත මම දනිමි" යි පසුද තෙරුන් වහන්සේ පිඬු සිඟා ගිය විට තෙමේ විහාරයේ නැවතී සිට පොල්ලක් ගෙන සියලු සැළි වළන් බිඳ දමා පන්සලත් ගිනි තබා පැන ගියේ ය.

වඤ්චනික හිමිනම වැඩි දවස් නො ගෙවා ම කලුරිය කොට අවීචි-මහානරකයෙහි උපන්නේ ය. මිනිස්සු මේ තොරතුරු අසා "මහාකාශ්‍යප තෙරුන් වහන්සේගේ ශිෂ්‍යයෙකු අකීකරු ව තරහ වී පන්සලත් ගිනි තබා පලා ගොසිනැ" යි කියා තැන තැන රැස්ව කථා කරන්නට වූහ. මඳ කලකට පසු ව එක්තරා භික්‍ෂූන් වහන්සේනමක් බුදුරජාණන් වහන්සේ දකිනු කැමැත්තෙන් රජගහ නුවරින් නික්ම දෙව්රම් වෙහෙරට වැඩම කළහ. වැඩම කළා වූ ඒ ආගන්තුක භික්‍ෂුවගෙන් බුදුරජාණන් වහන්සේ මහාකාශ්‍යප මහරහතන් වහන්සේ පිළිබඳ තොරතුරු අසා වදළ සේක.

"වරදෙක් නැත. සුව සේ වාසය කරති. නොබෝද ශිෂ්‍යයෙකු කිපී වැඩඉන්නා පන්සල් ගෙය ගිනි තබා පැන ගොසිනැ"යි කීහ.

එකල්හි බුදුරජාණන් වහන්සේ "මහණ, එම පුද්ගලයා අවවාදයට කිපෙනුයේ, ගුරුන්ට දෙස් නඟන්නේ අද පමණක් නො වේ. මහණ, මේ තෙමේ පෙර භවවල ද අවවාදයට කිපී මෙසේ විපත් කළේ ය. මාගේ පුත්‍ර වූ කාශ්‍යපට මෙබඳු බාලයන් හා එක් ව වාසය කරනවාට වඩා හුදකලා ව වාසය කිරීම යහපත ය. සැපදයක ය"යි ද වදරා "**චරං චේ නාධිගච්ඡෙය්‍ය**" යන ගාථාව වදළහ.

දේශනාව අවසානයෙහි ආගන්තුක භික්‍ෂුව සෝතාපත්ති ඵලයට පැමිණියේ ය. අන්‍ය වූ බොහෝදෙනා ද සෝවාන් ඵලාදියට පැමිණියෝ ය. දේශනාව මහජනයාට වැඩ සහිත විය.

**ආත්මෝපදේශය** - ඥනවන්තයා කපටිකමින් රැවටිය නො හැක.

සාධු ! සාධු !! සාධු !!!

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**
**(ඇසළ 2553)**

**සම්පාදක:** පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසි
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

**පිටු සැකසීම:** පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

**ධර්මදනය:** පින්වත් ආර්. ඩී. දයාසීලී උපාසිකා මාතාව විසින් අභාවප්‍රාප්ත ඥතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් උපේක්‍ෂා පියරංගිකා මෙණෙවිය විසින් දෙමවුපියන්ට ආශීර්වාද පිණිස හා තමාට වහා චතුරාර්යසත්‍ය ධර්මය අවබෝධ කර ගැනීම පිණිසත් මෙම ධර්මදනය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්දයන් වහන්සේගේ ධර්මදේශනා ඇතුළු පටිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම්ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2009**